අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/2/29/20/01-II වෙළුම

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2025.08.14

**සියලුම සුදුසුකම්ලාභීන් වෙත.**

**<u>දිවයිනේ ජාතික පාසල්වල විදේශ භාෂා ඉගැන්වීමට ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 – 1 (අ) ශ්‍රේණිය උපාධිධාරීන් බඳවා ගැනීම - 2021 (2025)</u>** .

ඉහත බඳවා ගැනීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 2,233 හා 2021.06.18 දිනැති ගැසට් නිවේදනය අනුව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා උපාධියට හදාරා ඇති විදේශ භාෂා විෂය සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ අනුව අංක 25/1074/806/069 හා 2025-07-02 දිනැතිව අමාත්‍ය මණ්ඩලය ගනු ලැබූ තීරණය ප්‍රකාරව උක්ත ගැසට් නිවේදනය අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා නැවත ප්‍රායෝගික පරීක්ෂණ සිදු කිරීමට කටයුතු සූදානම් කර ඇත.

02. ඒ අනුව, එම ප්‍රායෝගික පරීක්ෂණය **2025.08.19** දින පෙ.ව. **9.00** සිට බත්තරමුල්ල, ඉසුරුපාය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ **7 වන මහල ශ්‍රවනාගාරයේදී** පැවැත්වෙන අතර ඒ සඳහා සහභාගී වන ලෙස ඔබට මෙයින් දන්වමි.

03. එම ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වෙන ආකාරය සහ ලකුණු ලබා දෙනු ලබන ආකාරය පහත පරිදි වේ.

3.1 අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.3.4 වගන්තිය අනුව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වන ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සූදානම්ව සහභාගී විය යුතු වේ. ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ "ආ" පරිශිෂ්ටයට අනුව ප්‍රායෝගික පරීක්ෂණය සිදු කරනු ලැබේ.

3.2 ප්‍රායෝගික පරීක්ෂණයේදී අයදුම්කරු විසින් හඳුනා ගන්නා ලද තමා ඉල්ලුම් කරන ලද විෂයට අදාළව පාසල් විෂය නිර්දේශයෙහි ඇතුළත් වන මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මෙ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | අරමුණ හා ප්‍රවිෂ්ට වීම | 05 | 02 |
| 2 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 3 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 4 | කාල කළමනාකරණය | 05 | 02 |
| 5 | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |



CamScanner

i. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විනාඩි 5කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.
ii. ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහ (25) කි.
iii. ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.
iv. ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ

**3.4 ලකුණු ලබා දෙන නිර්ණායකයන්හි අරමුණු**

**i. අරමුණ හා ප්‍රවිෂ්ට වීම**

සාර්ථකව පාඩමෙහි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම

**ii. පෞරුෂය හා හඬ පාලනය**

ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම

**iii. සන්නිවේදනයේ පැහැදිලි බව**

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම

**iv. කාල කළමනාකරණය**

ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළගා වීමේ කුසලතාවය ඇගයීම

**v. ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය**

අරමුණ කෙරෙහි ළගා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම

04. එසේම, ඔබ විසින් 2023.10.26 දිනැති පැවැත්වූ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරන ලද අධ්‍යාපන සහතික වල හා අනෙකුත් ලේඛන වල මුල් පිටපත් ද රැගෙන ඒම අනිවාර්යය වේ.

05. ඉහත ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නියමිත දිනයේ දී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව පසුව කිසිදු අයුරකින් සලකා බලනු නොලැබේ.

06. මෙම පරීක්ෂණය සඳහා සහභාගී වීම ගුරු පත්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන බව ද සැලකිය යුතුය.

07. මෙම පරීක්ෂණයට සහභාගී වීම සඳහා ගමන් වියදම් හෝ උපවේශන දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

මෙයට විශ්වාසී,

ඒ.ජේ.එස්.එස්.එදිරිසූරිය
අතිරේක ලේකම් (ගුරු ආයතන)

අත් කළේ: නාලක කළුවැව
ලේකම්

CamScanner